සැ. යු.- 2019.05.10 දින පළ වූ අංක 2,123 දරන *ගැසට් පත්‍රයේ* I:III, II, III කොටස් පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,124 - 2019 මැයි මස 17 වැනි සිකුරාදා - 2019.05.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 108 |


## සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 ජූනි මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මැයි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

319 - B 081523 — 353 (2019/05)
D 1 -

# විවිධ දැන්වීම්

## සිවිල් අධිකරණ බලය ක්‍රියාවේ යෙදවීම සඳහා කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය

සමාගම් පනතේ 270(ආ) 270(ඇ) 270(ඉ) සහ/හෝ 270(ඊ) වගන්තියෙන් සමග කියවිය යුතු සමාගම් පනතේ 272 සහ 274 වගන්තියත් යටතේ වන ඉල්ලීම පිළිබඳ කාරණාවයි.

නඩු අංකය : 19/19 CO.

මත්තේගොඩ, පොල්ගස්ඕවිට පාර, අංක 78/බී හි පිහිටි ස්ටෑෆර්ඩ් ඔරියන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ කාරණාව.

*සහ*

සමාගම් පනතේ 270(ආ) 270(ඇ) 270(ඉ) සහ/හෝ 270(ඊ) වගන්තියෙන් සමග කියවිය යුතු සමාගම් පනතේ 272 සහ 274 වගන්තියත් යටතේ ස්ටෑෆර්ඩ් ඔරියන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා වන ඉල්ලීම පිළිබඳ කාරණාවයි.

ස්ටෑෆර්ඩ් ඔරියන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක : 78/බී, පොල්ගස්ඕවිට, මත්තේගොඩ.

...........................*පෙත්සම්කරු.*

කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ, (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන) මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් ස්ටෑෆර්ඩ් ඔරියන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් වර්ෂ 2019ක් වූ අප්‍රේල් මස 03 වැනි දින ඉදිරිපත් කර ඇති බවත්, එකී පෙත්සම වර්ෂ 2019ක් වූ අගෝස්තු මස 06 වැනි දින මහාධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීම සම්බන්ධයෙන් සහය දැක්වීමට අපේක්ෂා කරන එකී සමාගමේ යම් ණය හිමියකු හෝ දායකයෙකු නඩුව අසනු ලබන අවස්ථාවේ දී එම කාර්ය සඳහා තම නීතිඥවරයා මගින් පෙනී සිටිය හැකි බවත්, අවශ්‍ය කරන එකී සමාගමේ ණය හිමියකුට හෝ දායකයෙකුට ඒ සඳහා වූ නියමිත ගාස්තු ගෙවූ පසු පහත අත්සන් කළ අය විසින් පෙත්සමේ පිටපතක් සපයනු ලබන බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන් කළේ* : නීතිඥ සනත් විජේවර්ධන
අංක 28, විල්සන් වීදිය, උසාවිය පාර, කොළඹ 12.

*සටහන* : එකී පෙත්සම අසනු ලබන අවස්ථාවේදී පෙනී සිටීම අපේක්ෂා කරන යම් තැනැත්තකු විසින් එසේ කිරීමට ඇති තම අපේක්ෂාව දැන්වීම ලිඛිතව ඉහත නම් සඳහන් නීතිඥ සනත් විජේවර්ධන වෙත ලබාදිය යුතු ය. *නැතහොත්* තැපැලෙන් එවිය යුතු ය. දැන්වීමේ පුද්ගලයාගේ නම හා ලිපිනය ප්‍රකාශ කළ යුතු ය. *නැතහොත්* සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය ප්‍රකාශ කළ යුතු අතර, එයට එම තැනැත්තා විසින් හෝ සමාගම විසින් *නැතහොත්* (සිටී නම්) ඔහුගේ හෝ ඇයගේ නීතිඥවරයකු විසින් අත්සන් කළ යුතු වන අතර, එය වර්ෂ 2019ක් වූ අගෝස්තු මස 05 වන දින පස්වරු 6.00ට පෙර ඉහත නම් සඳහන් අයට ලැබෙන සේ භාරදිය යුතු ය. *නැතහොත්* තැපැලෙන් එවනු ලබන්නේ නම් ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ඇතිව තැපැලෙන් එවිය යුතු ය.

නීතිඥ සනත් විජේවර්ධන.

අංක 28, විල්සන් වීදිය,
උසාවිය පාර,
කොළඹ 12.

05-399

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.